දිවි තොර කරගැනීම් යනු බරපතල, නමුත් මැදිහත්වීම් හරහා අවම කර ගත හැකි මහජන සෞඛ්‍ය ගැටලුවක් ලෙසින් හඳුනාගත හැක. මාධ්‍ය විසින් දිවි තොර කරගැනීමේ සිදුවීම් වාර්තා කිරීමේදී නිසි මාධ්‍ය මාර්ගෝපදේශ පිළිපැදීමෙන්ද ඊට දායකත්වයක් ලබාදිය හැකි වේ.

පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.ඒ. සුමන්තිරන්ගේ නිවසේ ආරක්ෂාවට යොදවා සිටි යුද හමුදා සෙබළෙකු දිවි තොර කරගත් බවට පැවසෙන පුවතක් පසුගිය දිනවල පුවත්පත් රැසකම වාර්තා වී තිබිණි. සන්ඩේ ඔබ්සර්වර් (ජූනි 5, 2022), දිවයින, ලංකාදීප සහ මව්බිම (ජූනි 6, 2022) යන පුවත්පත් එම පුවත වාර්තා කළ පුවත්පත් අතර වේ.

1) දිවි තොර කරගැනීමේ ආකාරය සඳහන් කිරීමත්, එවැනි පුවත් ප්‍රමුඛතාවයෙන් යුතුව වාර්තා කිරීම හරහා දිවි තොර කරගැනීමට නැඹුරුතාවයක් ඇති අයෙකුට එවැනි ක්‍රියාවකට උත්තේජනයක් ලැබිය හැක.

2) 'Sunday Observer' පුවත්පතේ පුවත් සිරස්තලයෙහි "commits suicide" ලෙස දක්වා තිබුණි. එම යෙදුම හරහා අපරාධී ක්‍රියාවක් කළ බව හැඟවෙන අරුතක් ලබා දීම නිසා, ඒ වෙනුවට "death by suicide" වැනි වඩාත් සංවේදී යෙදුමක් භාවිතා කිරීම උචිත වේ.

ඊට ප්‍රතිවිරුද්ධ ලෙසින්, 'The Morning' පුවත්පත "death by suicide" යන වඩාත් සංවේදී යෙදුම භාවිතා කිරීමට ප්‍රවේශම් වී තිබිණි.

3) 'The Morning' හැර අනෙක් සියලුම පුවත් වාර්තාවන්හි හදිසි උපකාරක අංක ඇතුළත් වී නොතිබුණි. උපකාරක අංක පළ කිරීමෙන්, හුදු දිවි අහිමි කරගැනීමක් වාර්තා කිරීමකින් එහා ගොස් තවත් ජීවිතයක් බේරා ගැනීමේ වගකීම ඉෂ්ට කිරීමට ද මාධ්‍ය වෙත හැකියාව ලැබෙනු ඇත.

'The Morning' පුවත්පත (ජූනි 06, 2022) තුළ, මෙම පුවත දිවි තොර කරගැනීම් වාර්තා කිරීම පිළිබඳ මාධ්‍ය මාර්ගෝපදේශයන්ට අනුකූලව වාර්තා වී තිබූ ආකාරය සැබැවින්ම ප්‍රශංසනීය බව සඳහන් කළ හැක.

උපකාරක අංකයක් පළකරමු, ජීවිතයක් රැකගනිමු!